(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 7(6).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා**

---

## 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 321 වගන්ති යටතේ මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 08 දිනැති අංක 2018/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත, 2016 ඔක්තෝබර් 04 දිනැති අංක 1987/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2017 නොවැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1687/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ පාසල් 331ක විදුහල්පතිවරුන් නොමැති බවත්; වැඩබලන විදුහල්පතිවරුන් ලෙස 252 දෙනෙකු කටයුතු කරන බවත්;

(ii) මෙම වැඩබලන විදුහල්පතිවරුන්, ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත්කොට ඇති බවත්;

(iii) පට්ටිරිප්පු අධ්‍යාපන කලාපයේ, පෝරතීවුප්පත්තුව කොට්ඨාසයේ 1 ඒ සහ බී ශ්‍රේණියේ පාසල් නොමැති බවත්;

(iv) එම කොට්ඨාසයේ ගණිතය හා විද්‍යාව විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක්ද පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාසල් 331 සඳහා විදුහල්පතිවරුන් පත්කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) වැඩබලන විදුහල්පතිවරුන් 252 දෙනාගේ තත්ත්වය කවරේද;

(iii) පෝරතීවුප්පත්තුව කොට්ඨාසයට 1 ඒ සහ බී ශ්‍රේණියේ පාසලක් ලබාදිය හැකිද;

(iv) ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා වූ ගුරු හිඟය පියවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2121/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දිනට සහ 2017.06.30 දිනට,

(i) යාපනය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා යුද හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) එම කඳවුරුවලට අනුයුක්තව සේවය කළ මුළු නිලධාරීන් සංඛ්‍යාව හා සෙබළුන් සංඛ්‍යාව;

(iii) එක් එක් කඳවුරෙහි නම, පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අනුයුක්තව සිටි නිලධාරීන් සහ සෙබළුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015.01.09 දින සිට 2017.06.30 දින දක්වා යාපනය දිස්ත්‍රික්කයෙන්,

(i) ඉවත් කර ඇති යුද හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) යුද හමුදා කඳවුරුවලින් ඉවත් කර ඇති නිලධාරීන් හා සෙබළුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) යාපනය දිස්ත්‍රික්කයෙන් යුද හමුදා කඳවුරු, ඒවායේ සේවයේ නියුතු නිලධාරීන් සහ සෙබළුන් ඉවත් කිරීම ජාතික ආරක්ෂාව කෙරෙහි සෘණාත්මකව බලපෑ හැකි බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2125/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ මාර්තු මස මන්නාරම දිස්ත්‍රික්කයේ ආරම්භ කළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථානය (Study Centre) මේ දක්වා තාවකාලික ගොඩනැගිල්ලක ක්‍රියාත්මක වෙමින් පවතින බවත්;

(ii) ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කර ඇතත්, මේ දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

(iii) 2017.06.20 දින ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන මෙන් මවිසින් ලිඛිත ඉල්ලීමක් සිදු කළ බවත්;

(iv) උතුරු පළාතේ, වවුනියාව, මුලතිව්, යාපනය හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක හතර තුළ විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන/ අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා ස්ථිර ගොඩනැගිලි තිබෙන නමුත්, මන්නාරම දිස්ත්‍රික්කය සඳහා පමණක් ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) ඉදිරියේදී සිදු කරනු ලබන මුදල් වෙන්කිරීම්වලදී, දැනට මන්නාරම දිස්ත්‍රික්කයේ තාවකාලික ගොඩනැගිල්ලක ක්‍රියාත්මක වන විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඔබ අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2188/'17

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේදී මීනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පාසල්වල නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, නව ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම් කර ඇති පාසල් හා ඊට අදාළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මීනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පාසල්වල අඩක් නිමකළ ගොඩනැගිලි තිබේද;

(iv) එසේ නම්, එම පාසල් හා අදාළ ගොඩනැගිලි පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මීනු/මෛත් විජය ආදර්ශ පාසල නමින් නව පාසලක් මීනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ අලුතින් ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) 6 සිට 13 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසලක් ඉදිකිරීම සඳහා මෙම ප්‍රතිපාදන ප්‍රමාණවත්ද;

(iv) මෙම පාසලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාලය කොපමණද;

(v) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2194/'17

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට අනුව මත්පැන් හා දුම්පානය කිරීමේ දර්ශන ඇතුළත් ටෙලිනාට්‍ය, චිත්‍රපට හෝ දැන්වීම් ප්‍රචාරය තහනම් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පාලනය කෙරෙන ස්වාධීන රූපවාහිනී නාලිකාව 2017.02.11 වැනි දින ප.ව. 7.30ත් 8.00 ත් අතර විකාශය කළ "ස්වේත ගංගිර" ටෙලි නාට්‍යයේ ජවනිකාවක, නිළියක දුම්පානය කරන අයුරු ඉතා පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කළ බවත්;

(ii) විශේෂයෙන් කාන්තාවක් දුම්පානය කරන දර්ශන විකාශය කිරීම හේතුවෙන් දුම්පානය සඳහා උත්තේජනයක් ඇති වියහැකි බවත්;

(iii) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක විධිවිධාන රජයේ ජනමාධ්‍ය ආයතනයක් විසින්ම කඩ කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම විකාශය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර මින් ඉදිරියට එවැනි සිදුවීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2216/'17

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂය දක්වා උතුරු නැගෙනහිර ප්‍රදේශවල දෙමළ පුනරුත්ථාපන සංවිධානය නමැති ස්වේච්ඡා සංවිධානයක් ක්‍රියාත්මක වූ බවත්;

(ii) 2006 වර්ෂයෙන් පසු එහි ක්‍රියාකාරකම් අත්හිටුවා ඇති බවත්;

(iii) මෙම සංවිධානය ශ්‍රී ලංකාව තුළ තහනම් කරන විට රුපියල් කෝටි ගණනක මුදලක් ශ්‍රී ලංකාව තුළ පිහිටි බැංකු විසින් අත්හිටුවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දෙමළ පුනරුත්ථාපන සංවිධානය ශ්‍රී ලංකාව තුළ අනුමත ස්වේච්ඡා සංවිධානයක් වශයෙන් ක්‍රියාකාරී වූ කාලවකවානුව කවරේද;

(ii) මෙම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ගිණුම් පවත්වාගෙන යනු ලැබූ බැංකු කවරේද;

(iii) එම එක් එක් බැංකුවේ තැන්පත් කර තිබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ස්වේච්ඡා සංවිධානය ශ්‍රී ලංකාව තුළ තහනම් කරන ලද දිනය කවරේද;

(ii) තහනම් කරන අවස්ථාවේදී මෙම සංවිධානය සතුව තිබූ චංචල, නිශ්චල හා ද්‍රවශීල වත්කම්වල වටිනාකම කොපමණද;

(iii) එම වත්කම්වලට සිදුවූයේ කවරක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2233/’17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලීකරණය සඳහා සමාගම් දෙකකින් යෝජනා ඉදිරිපත් කර තිබුණේද;

(ii) එසේ නම්, එම සමාගම්වලින් එක් සමාගමක් තෝරාගන්නා ලද පදනම කවරේද;

(iii) එම සමාගම තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මඟින් ලබාදුන් නිර්දේශ කවරේද;

(iv) තෝරාගත් සමාගම සමඟ අත්සන් කරන ගිවිසුම් දෙක කවරේද;

(v) එම ගිවිසුම් මඟින් ස්ථාපනය කරන සමාගම් දෙකෙහි කොටස් බෙදීයන ආකාරය කවරේද;

(vi) එම සමාගම් දෙකට පැවරෙන කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එම සමාගම්වලට ලැබෙන ආදායම් මාර්ග කවරේද;

(viii) දැනට සේවය කරන සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ix) වරායේ නඩත්තු කටයුතු පැවරෙන සමාගම කවරේද;

(x) මෙම පෞද්ගලීකරණය හරහා රජයට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබෙන ආදායම් ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 දෙසැම්බර් මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

690/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය මඟින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වේවැල් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් ආදායම කොපමණද;

(iii) එකී නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ වේවැල් කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1738/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සහ 2016 වර්ෂවලට අදාළව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා 2016.10.18 දිනැති විගණන විමසුමක් නිකුත් වී තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම විගණන විමසුමේ පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව, අංක 2, ආ, ඇ, ඈ, ඉ සහ ඊ යන වගන්තිවල දැක්වෙන කරුණු සහ අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2169/'17

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගත් නිවාස, ගොඩ ඉඩම් හා කුඹුරු ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමට සිටින පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(ii) දේපළ අත්පත් කරගෙන ඇතත්, 2014 ඔක්තෝබර් සිට මේ දක්වා වන්දි නොගෙවූ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(iii) මේ දක්වා වන්දි නොගෙවීමට හේතු කවරේද;

(iv) වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කරනු ලබන පදනම කවරේද;

(v) වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(vii) නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමේ පදනම කවරේද;

(viii) මේ දක්වා වන්දි නොලැබ අගතියට පත්වූවන්ට කඩිනමින් වන්දි ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2187/’17

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරුවරුන් නව දැනුමෙන් පෝෂණය කිරීමට ගුරු පුහුණු වැඩසටහන් ඉවහල් වන බව පිළිගන්නේද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කලාප හා විෂය මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබුවේද;

(iii) එසේ සංවිධානය කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, විෂයයන් හා ඊට වැය වූ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016.06.06 දිනට බස්නාහිර පළාතේ, මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව කොපමණද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඔවුන් පුහුණු කිරීමට පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව සහ ඊට වැය වූ මුදල, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ සඳහා වෙන්කළ මුදල හා ක්‍රියාත්මක කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) ගුරු පුහුණු වැඩසටහන්වලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි බව දන්නේද;

(v) ජාතික අවශ්‍යතාවයක් සේ සලකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ගුරු පුහුණු වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2192/’17

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම පවත්වාගෙන යනු ලැබූ ගුවන් ගමන් වැඩසටහන්, 2016.10.30 දින සිට සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත පවරා ගත් බව දන්නේද;

(ii) ඊට සමගාමීව සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත බඳවා ගත් මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එසේ බඳවා නොගෙන සේවය අවසන් කළ මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) සේවය අවසන් කළ එක් එක් සේවකයාට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2016.12.31 දිනෙන් පසුව සේවයේ යොදවා සිටින අයගේ නම් හා තනතුරු කවරේද;

(vi) 2016.12.31 දින තෙක් උපදේශක තනතුරු දරමින් සේවය කළ පිරිස කොපමණද;

(vii) ඉහත (vi) හි සඳහන් පිරිස අතරින් ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා ඇති සංඛ්‍යාව කොපමණද, ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් සහ වැටුප් හෝ දීමනා කොපමණද;

(viii) ප්‍රමාණවත් වන්දි නොලැබීම නිසා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ix) ඔවුන්ට හිඟ වන්දි මුදල් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2196/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල සේවය කරන කම්කරුවන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා 2016 වර්ෂය අවසාන වනවිටත්, වසර ගණනාවක සිට එම කම්කරුවන්ට ගෙවා නැති බව පිළිගන්නේද;

(ii) මෙම වතුවල සේවයේ යෙදී සිටින කම්කරුවන් සංඛ්‍යාව හා මේ වනවිට ඔවුන්ට ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අරමුදල් ලැබිය යුතු සමහර කම්කරුවන් මේ වනවිට මියගොස් ඇති අතර මෙම මුදල් ඔවුන් වෙත නොගෙවීමෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට බරපතල අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම මුදල් වහාම කම්කරුවන්ට ගෙවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2283/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන කටයුත්තක් සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ, 2017 පෙබරවාරි 13 දිනැති අංක 2006/11 දරන ගැසට් නිවේදනය මඟින්, කොටපොල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන ලද ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, මේ වනවිට අදාළ පවරා ගැනීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2433/'17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලිකරණය කිරීමේ ගිවිසුම මඟින් ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදෙන පදනම කවරේද;

(ii) මෙම ගිවිසුම මඟින් මෙහෙයුම් පර්යන්ත සඳහා ලබාදෙන ඉඩම් සඳහා බදු කුලියක් අය කරන්නේද;

(iii) මෙම වරායේ තෙවැනි සහ සිව්වැනි අදියර ඉදිකිරීමේ අයිතිය ගිවිසුම්ගත සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(v) හම්බන්තොට වරායේ දෙවැනි අදියරේදී, ඉදිකරන ලද අක්කර 110ක විශාල දූපත මෙම සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(vi) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(vii) මේ සඳහා දේශීය හෝ ජාත්‍යන්තර සමාගමක් මඟින් තක්සේරුවක් ලබාගෙන තිබේද;

(viii) නොඑසේ නම්, එම වටිනාකම නිර්ණය කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 දෙසැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

691/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙය රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි කර්මාන්තයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පන් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ පන් කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1233/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1378/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 132ට අනුව, පොලොන්නරුව, කිලිනොච්චිය සහ රත්නපුර (ඇඹිලිපිටිය) දිස්ත්‍රික්කයන්හි සුවිශාල ගබඩා තුනක් ඉදිකිරීමට සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉදිවන ගබඩාවේ වැඩ නිම කිරීමට රුපියල් මිලියන 1000 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) මන්නාරම දිස්ත්‍රික්කයෙහි ඉදිකෙරෙන ගබඩාවෙහි මුල් පිරිවැය ඇස්තමේන්තුව සහ මේ දක්වා වූ එහි ප්‍රගති සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිළිනොච්චිය, ඇඹිලිපිටිය හා පොලොන්නරුවෙහි නව ගබඩා සංකීර්ණ තුන ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(iv) 2015 අයවැය යෝජනා අංක 132 වෙනුවෙන් වෙන් කළ රුපියල් මිලියන 1000 ක මුදල වැය කළ ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1517/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව වෙනුවෙන් රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම කමිටුවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) එකී කමිටුවට සාමාජිකයන් පත් කිරීමේ දී සලකා බැලූ නිර්ණායක කවරේද;

(iv) බුද්ධාගම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති දෙවන පරිච්ඡේදය ඒ අයුරින්ම පවත්වා ගෙන යෑමට නිර්දේශ කර ඇති කමිටු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1898/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් සභාවේ මහජන නියෝජිතයන් හා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ විදේශ අධ්‍යයන චාරිකාව සම්බන්ධයෙන් අනාවරණය කර ඇති ඡේද අංක 3 (අ) (i) සිට (x) දක්වා කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළ වාර්තාවේ (ආ) (i) සිට (iii) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2189/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය අමාත්‍ය මණ්ඩල සංශෝධනයට අනුව වර්තමාන රජයේ සම්පූර්ණ කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශ අධීක්ෂණ කටයුතු පැවරූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) කැබිනට් අමාත්‍යවරයෙකු සඳහා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

(v) අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී අලුතින් වැඩි කරන ලද අමාත්‍යාංශ සඳහා 2017 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2198/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල වතුකරයේ බස්රථ ධාවනය වන ග්‍රාමීය මාර්ග කාපට් ඇතිරීමට හෝ තාර දමා සංවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඒ සඳහා වෙන් කර තිබූ මුදල කොපමණද;

(iii) එමඟින් ඉදිකරනු ලබන මාර්ග පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉදිරියේදී වතුකරයේ මාර්ග සංවර්ධනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2217/'17

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, පච්චිලෙපල්ලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් මුහමාලෙයි ගම්මානය පිළිබඳව;

(ii) එම ගම්මානයේ භූමි ප්‍රමාණය සහ ජනගහනය පිළිබඳව;

(iii) එම ප්‍රදේශයේ බිම් බෝම්බ වළලා ඇති බවත්, ඒවා මේ වනවිට ඉවත් කරමින් සිටින වැඩසටහන සඳහා මූල්‍යාධාර සපයනු ලබන අය පිළිබඳව;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බිම් බෝම්බ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(ii) එම ප්‍රදේශය මහජනතාවට පදිංචිවීම සඳහා භාරදීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

(iii) නැවත පදිංචි කිරීම්, නිවාස යෝජනා ක්‍රම පහසුකම් ඔවුන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

692/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිත්තල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙය රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි කර්මාන්තයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පිත්තල නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ පිත්තල කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1245/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට අම්පාර දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුදමය තත්ත්වය නිමවන තුරු, පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1750/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රූපවාහිනී නාලිකාව පවත්වාගෙන යනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් රූපවාහිනී නාලිකාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ආරම්භ කර ඇති රූපවාහිනී නාලිකාවලින් දැනට විකාශනය පවත්වාගෙන නොයන නාලිකා තිබේද;

(ii) එසේ නම්, එම නාලිකා කවරේද;

(iii) රූපවාහිනී නාලිකා නියාමනය සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iv) එම නියාමනය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(v) ද්වේශ සහගතව හා උපහාසාත්මකව යම් යම් නාලිකා මගින් සිදු කරන බරපතල සමාජ හානි වැළැක්වීම සඳහා රූපවාහිනී නාලිකා නියාමනය කිරීමට කඩිනමින් විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2069/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ජනවාරි මාසයේ සිට යාපනය දිස්ත්‍රික්කයේ, තෙලිප්පලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලිකාමම් උතුර, ඌරණි ප්‍රදේශයේ ජනතාව නැවත පදිංචි කරනු ලැබූ බවත්;

(ii) ඒ අනුව දැනට එහි පවුල් 20ක් ජීවත්වන බවත්;

(iii) මෙම ජනතාවට තම ජීවනෝපාය උපයාගැනීම සඳහා වූ ව්‍යවසායන්වල යෙදීමට කිසිදු ආම්පන්නයක් නොමැති වීම හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්වී සිටින බවත්;

(iv) මෙම ජනතාව නැවත පදිංචි කරනු ලැබූ අවස්ථාවේ ඔවුන්ට රැකියාවල යෙදීම සඳහා ආම්පන්න ලබාදෙන බවට පොරොන්දු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනතාවට රැකියා ආම්පන්න ලබාදීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ආම්පන්න ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2122/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෙට්‍රල් ආනයනයේදී පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අයකරනු ලබන ආනයනික බද්ද කොපමණද;

(ii) පෙට්‍රල් ලීටරයක් සඳහා රජය විසින් ආනයන බද්ද හැර වෙනත් බදු අය කරන්නේද;

(iii) එසේ නම්, එම බදු කවරේද;

(iv) එක් ලීටරයක් සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණය, එක් එක් බදු වර්ගය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙට්‍රල් ලීටරයක් සඳහා රජය විසින් අයකරනු ලබන මුළු බදු ප්‍රමාණය, පෙට්‍රල් ලීටරයක සිල්ලර අලෙවි මිලෙහි කවර ප්‍රතිශතයක්ද;

(ii) පෙට්‍රල් ලීටරයක් සඳහා රජය අයකරනු ලබන සියලු බදු ඉවත් කලහොත් පාරිභෝගිකයාට පෙට්‍රල් ලීටරයක් ලබා දිය හැකි සිල්ලර මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෙට්‍රල් ලීටරයක් සඳහා රජය විසින් විවිධ වර්ගයේ බදු අය කිරීම භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් වැඩිවීමට බලපා ඇති බවත්;

(ii) පෙට්‍රල් ලීටරයක් සඳහා රජය අයකරනු ලබන සියලු බදු ඉවත් කළහොත් භාණ්ඩ හා සේවාවල මිල අඩුකිරීමට හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2141/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි නැංගුරම් තොටුපළ සංඛ්‍යාව හා ඒවා පිහිටි ස්ථාන කවරේද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ ලියාපදිංචි බහුදින හා එක්දින ධීවර බෝට්ටු සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජීවත්වන ධීවරයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 වර්ෂයේ සිට මේ දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ,

(i) ධීවර යටිතල පහසුකම් නැංවීමට වැය කරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) සහනාධාර පදනම මත බෙදා දී ඇති බහුදින හා එක්දින යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) සහනාධාර පදනම මත බෙදා දී ඇති ධීවර ආම්පන්න කට්ටල, පණිවිඩ හුවමාරු යන්ත්‍ර සහ ජීවිත ආරක්ෂක කබා පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2174/’17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ද්විත්ව පුරවැසියෙකු වීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමට නුසුදුසුකමක් බව පිළිගන්නේද;

(ii) යම් පුද්ගලයෙකු ද්විත්ව පුරවැසියෙකු දැයි නිර්ණය කිරීමට රජය භාවිතා කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2218/’17

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කිලිනොච්චිය නගර ග්‍රාමනිලධාරී වසමේ පිහිටා ඇති පරවිපාඤ්ජාන් ප්‍රදේශය පිළිබඳවත්;

(ii) එම ප්‍රදේශයේ නැවත පදිංචි කිරීමේ කටයුතු මෙතෙක් සම්පූර්ණ වශයෙන් අවසන් වී නොමැති බවත්;

(iii) හමුදා පාලනය යටතේ පැවති එම ප්‍රදේශයේ දීර්ඝ කාලයකින් පසුව ජනතාව ක්‍රම ක්‍රමයෙන් නැවත පදිංචි කළ බවත්;

(iv) මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට අයිති ඉඩම් වහාම හමුදාවෙන් මුදා හැර එම ජනතාවට ලබාදෙන බවට ජනාධිපතිතුමා විසින් දැනුම් දී ඇති බවත්;

(v) අක්කර 17.2ක ඉඩම් ප්‍රමාණයක් තවමත් මුදාහැර නොමැති බවත්;

(vi) ඒ හේතුවෙන්, එම ඉඩම් අයිති පවුල් 56ක් මේ වනවිට පදිංචි වීමට ස්ථානයක් නොමැතිව අසරණ තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනාධිපතිතුමාගේ දැනුම්දීම අනුව එම ඉඩම් සම්පූර්ණ වශයෙන් මුදාහැර තිබේද;

(ii) අක්කර 17.2ක ඉඩම් මුදා හරිනු ලබන දිනය කවරේද;

(iii) ඉහත (අ) vi හි සඳහන් පවුල් 56 නැවත පදිංචි කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 දෙසැම්බර් මස 09 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

839/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇතැම් නගරාන්තර දුරගමන් සේවා සීඝ්‍රගාමී දුම්රියවල නිදන මැදිරි ජරාජීර්ණ වී ඇති බවත්;

(ii) ඇතැම් දුම්රියවල ආපනශාලා පහසුකම් නොමැති බවත්;

(iii) පවතින ආපනශාලා විධිමත් නොවන බවත්;

(iv) දුම්රිය ආපනශාලාවල ප්‍රමිතියෙන් බාල ආහාරපාන අධික මිල ගණන්වලට විකුණනු ලබන බවත්;

(v) ඉහත සඳහන් කරුණු හේතුකොට ගෙන දුම්රිය මඟීන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත දුම්රියවල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන පියවර කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුදල ඇස්තමේන්තුගත කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1386/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 144 යටතේ, ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 150 ක් පමණ වන බව සඳහන් කර ඇති බැවින්, 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන ප්‍රමාණය හා අපනයන වටිනාකම දැක්වෙන ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) යුරෝපා වෙළඳපොළට මත්ස්‍ය අපනයන තහනම් කිරීමට තුඩු දුන් හේතු සාධක කවරේද;

(iii) තහනම ඉවත් කරවා ගැනීම සඳහා, එවකට ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) යුරෝපා වෙළඳපොළට මත්ස්‍ය අපනයන තහනම ඉවත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒ අනුව මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1469/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) දැනට ස්ථිර ග්‍රාම නිලධාරියෙකු සිටින ග්‍රාමනිලධාරී වසම් හා එහි සේවයේ නියුතු ග්‍රාම නිලධාරින්ගේ නම් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1743/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද පත්වීම්ලාභීන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1872/'17

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුබැද්ද, බණ්ඩාරනායක මාවතේ දකුණු පස පිහිටි ජලාශය වටා ඇවිදින මංතීරුවක් ඉදිකරමින් තිබියදී එහි වැඩ අතරමග නවතා දැමූ බවත්;

(ii) නැවත මං තීරුවේ වැඩ අරඹා විශාල වැඩ කොටසක් නිමකර තිබියදී, එහි කොන්ත්‍රාත්කරු විසින් වැඩ නවතා 2016.09.12 දින යන්ත්‍රසූත්‍ර ද ඉවත් කරගෙන යෑමෙන් යළිත් එහි වැඩ ඇණ හිට ඇති බවත්;

(iii) මේ වනවිට එම ජලාශයට සහ ඒ අවට ප්‍රදේශයට කුණු බැහැර කිරීම සඳහා භාවිතා කිරීම හේතුවෙන් විශාල පරිසර දූෂණයක් සිදුවී මදුරු ගහනයද විශාල වශයෙන් වැඩි වී ඇති බවත්;

(iv) මංතීරුව ඉදිකිරීම නවතා දැමීම හේතුවෙන් පවිත්‍ර කළ ජලාශය හා ඇළ මාර්ගය මේ වනවිට මුළුමනින්ම වල්බිහිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මංතීරුව ඉදිකිරීමට සහ අධිකව අපවිත්‍ර වී ඇති ජලාශය පවිත්‍ර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වැඩ යළි ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) මෙතෙක් සිදුකළ කටයුතු වෙනුවෙන් දැරූ වියදම වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, මතුගම අධ්‍යාපන කලාපයේ පිහිටි කලෙලමගල් දෙමළ විද්‍යාලයේ ශිෂ්‍යයන් හාරසියයකට අධික පිරිසක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබමින් සිටින බවත්;

(ii) මෙම පාසල "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා මාස දෙකකට පෙර මුල්ගල් තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඉහත පාසලෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම පන්ති ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත තුළ දියත් කරන ලද වාරි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාරි ව්‍යාපෘතිවල නම් කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන ග්‍රාම නිලධාරි වසම් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවල අරමුණු කවරේද;

(v) ජල හිඟයෙන් පීඩා විඳින වයඹ ජනතාව වෙනුවෙන් අමාත්‍යාංශය ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2284/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) අ ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එම නිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුණේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 ජනවාරි මස 12 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.199/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව අපේ රටට කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.200/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුණේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.201/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.202/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— පුත්තලම දිස්ත්‍රික්කය අතිශය සුන්දර වෙරළ තීරයකට හිමිකම් කීවද, වෙරළ ඛාදනය, කඩොලාන විනාශ වීම, අනවසර ඉදිකිරීම් වැනි හේතු නිසා වෙරළ තීරය දූෂණයට ලක්වී ඇති බැවින්, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.203/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වූවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට  ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.204/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පාසල් හා ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— පසුගිය වසර කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දැඩි කඩාවැටීමකට ලක් වී ඇති බැවින්, ජාතික කණ්ඩායමට දක්ෂ ක්‍රීඩකයන් සොයා ගැනීම සඳහා පාසල් හා ක්‍රීඩා සමාජ මට්ටමින් ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කළ  යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.205/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.206/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.207/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, වත්මන් යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ  කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.